# රණවිරු ජයග්‍රහණය ආපසු හැරවීම

දහහත්වැනි ව්‍යවස්ථා සංශෝධනය ගැන නැවතත් සිතා බැලිය යුතු කාලය එළඹී ඇත. විශේෂයෙන්ම කොටි ත්‍රස්තවාදීන් පරදවා හමුදාව ජයගැනීමට ඔන්න මෙන්න කියා ඇති අවස්ථාවක මෙය ගැඹුරින් සාකච්ඡා කළ යුතු වෙයි. දහහත්වැනි ව්‍යවස්ථා සංශෝධනය කඩිමුඩියේ කරගනු ලැබුවකි. එයට එකල ජ වි පෙරමුණ ද සහාය දුන්නේ ය. මෙහි දී එකල යන්න අවධාරණය කෙරෙනුයේ ජ වි පෙ මෙකලට වඩා එදා ජාතිකත්වයට නැඹුරු වූ හෙයිනි. ජ වි පෙ ඒ පක්ෂය පිහිටුවනු ලැබූ මුල් කාලයේ සිට ම අවලම්බයක් මෙන් ජාතිකත්වය හා මාක්ස්වාදය අතර දෝලනය වෙයි. අද අවලම්බය මාක්ස්වාදය වෙතට යන කාල පරිච්ඡේදයක් වෙයි. විමල් වීරවංශ මහතාට ජ වි පෙරමුණෙන් කැඩීමට සිදුවූයේ ද, ඒ පක්ෂය ආපසු මාක්ස්වාදය දෙසට ගමන අරඹා ඇති බැවිනි. එදා ජාතිකත්වයට දෝලනය වී තිබුණු ජ වි පෙරමුණ ද චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ ශ්‍රී ල නි පක්ෂය ද, කඩිමුඩියේ ම දහහත්වැනි ව්‍යවස්ථා කෙටුම්පතට පක්ෂ වී ඇත. එහෙත් බටහිරයන්ගේ හා රාජ්‍ය නොවන පඬියන්ගේ උපදෙස් මත සකස් කෙරුණු පණතෙහි රඟසොබාව පිළිබඳ අවබෝධයක් නොමැතිව ඒ සම්මත කරගැනීමේ විපාක දැන් අපට අත්දැකීමෙන් ම දැනගත හැකි වී ඇත.

විධායක ජනාධිපති ක්‍රමය ඔස්සේ ජනාධිපතිතුමාට ඇති බලතල කප්පාදුකිරීමක් දහහත්වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් සිදුවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරුකිරීම හා ඊනියා මානව හිමිකම් ආරක්ෂාකිරීමක් ඉන් සිදුවන්නේ යැයි පඬියෝ අපට කීහ. ප්‍රවාදාත්මක ව හා නිරපේක්ෂව ගතහොත් එහි සත්‍යයක් වෙයි. එහෙත් ප්‍රශ්නය වනුයේ අන් සෑම සංකල්පයක් මෙන් ම ප්‍රජාතන්ත්‍රවාදය හා මානව හිමිකම් ද සාපේක්ෂවීම ය. අද අප ලංකාවේ ක්‍රියාත්මක කිරීමට දඟලන්නේ ලෝකයේ වෙන කොහේවත් නැති ප්‍රජාතන්ත්‍රවාදයකි. අද මෙරට ත්‍රස්තවාදීන්ට ද මානව හිමිකම් දීමට කතාකරන පඬියෝ වෙති. පොලීසියට බිම දමාගෙන පහර දුන් අය වුව ද අත්අඩංගුවට ගැනීමට ගිය විට මානව අයිතිවාසිකම් කාන්තා අයිතිවාසිකම් ආදිය මතුවෙයි.

දැනට මාස කිහිපයකට උඩදී ද කොටි ත්‍රස්තවාදීන්ගේ මානව අයිතිවාසිකම් වෙනුවෙන් ඉදිරිපත්වූවෝ සිටියහ. එංගලන්තය ආදී බටහිර රටවල් ප්‍රජාතන්ත්‍රවාදය උඩින් තිබෙන බව පෙන්වමින් යටින් ඉතා සියුම්ව රාජ්‍යය ආරක්ෂාකිරීම සඳහා යන්ත්‍රණයක් සකස්කර ඇත. ඔවුන්ගේ ප්‍රධාන කාර්යය මානව අයිතිවාසිකම් රැකීම නොව රාජ්‍යය රැකීම ය. එහෙත් ඒ බව මතුපිටට නො පෙනෙයි. රාජ්‍යය රැකීම හමුවේ මානව අයිතිවාසිකම් නො රැකෙයි. කලකට ඉහත දී බ්‍රිතානි පොලීසිය ත්‍රස්තවාදියකු යැයි සැකකළ බ්‍රසීල ජාතිකයකු ලන්ඩන් උමං දුම්රියපොළක දී මරා දැමී ය. එහි දී රාජ්‍යය රැකීම මානව අයිතිවාසිකම් රැකීමට වඩා වැදගත් විය. එහෙත් බටහිරයන්ට ලංකාවේ ඊනියා මානව අයිතිවාසිකම් රැකීම රාජ්‍යය රැකීමට වඩා වැදගත් වෙයි. මේ රකින මානව අයිතිවාසිකම් ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එකඟවන මානව අයිතිවාසිකම් ය.

අප ජේ ආර් ජයවර්ධන මහතාගේ ව්‍යවස්ථාවට විරුද්ධ වුවත් අද අපට කල්පනාකිරීමට ප්‍රධාන ප්‍රශ්නයක් ඇත. යම් අයුරකින් ජනාධිපතිතුමාට ව්‍යවස්ථාවෙන් ලැබෙන විධායක බලතල නොතිබිණි නම් කොටි ත්‍රස්තවාදය පරාජයේ අබියසට ගෙන එමේ හැකියාවක් තිබිණි ද? කොටි පැරදවීමේ ගෞරවය රණවිරුවන්ගෙන් උදුරාගැනීම මගේ අරමුණ නො වෙයි. ඇතැම්විට තුන් හතර දිනක් එක දිගට එකම ඇඳුම අඳිමින් නිදි නැතිව මුහුණ කට සෝදාගැනීමට අවස්ථාවක් නොලැබ අව්ව වැස්ස ආදිය ගැන නොසිතා රණවිරුවන් විසින් කරන ලද සේවය ඉතාමත් උදාර ය. අපි ඒ අවිවාදයෙන් පිළිගනිමු. එහෙත් සේනාධිනායක ලෙස ජනාධිපතිතුමන් විසින් දෙන ලද දේශපාලන නායකත්වය අපට කිසිලෙසකින්වත් අවතක්සේරු කළ හැකි නො වේ. ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය රැකීම සඳහා ව්‍යවස්ථාදායක සභා හා වෙනත් සභා ඇතිකරමින් බලතල කපාදමා තිබිණි නම් ජනාධිපතිතුමාට එවැනි නායකත්වයක් දිය හැකිව තිබිණි ද?

බ්‍රිතානියේ හා අනෙක් බටහිර රටවල ඉතා ශක්තිමත් රාජ්‍ය වෙයි. ඒ රටවල් මානව අයිතිවාසිකම් ගැන උඩින් වුව ද කතාකිරීමට එළඹුණේ රාජ්‍යය ශක්තිමත් කිරීමෙන් පසුව ය. එහෙත් අප රටේ ඊනියා වෙස්ට්මිනිස්ටර් රාජ්‍යයට අවුරුදු හැටක් ගෙවී ගිය ද ඒ එතරම් ශක්තිමත් නොවේ. රාජ්‍යය ශක්තිමත්වීමට කලින් අපි වෙස්ට්මිනිස්ටර් මානව අයිතිවාසිකම් රැකීමට දඟලමු. වෙස්ට්මිනිස්ටර් මානව අයිතිවාසිකම් රැකීමට අඩුම තරමින් එපමණට ශක්තිමත්

© Prof. Nalin De Silva

වෙස්ට්මිනිස්ටර් රාජ්‍යයක් තිබිය යුතු ය. එහෙත් අපි එවැනි ශක්තිමත් වෙස්ට්මිනිස්ටර් රාජ්‍යයක් නොමැතිව ම වෙස්ට්මිනිස්ටර් මානව අයිතිවාසිකම් රැකීමට දඟලමු.

අද ව්‍යවස්ථාදායක මණ්ඩලය සඳහා ඉදිරිපත් වී ඇති නම් හය ගැන කිවහැක්කේ කුමක් ද? ඒ නම්වලින් පිළිබිඹුවන ප්‍රජාතන්ත්‍රවාදය කුමක් ද? අද සිංහල ජනඅනුපාතය සියයට අසූවක් පමණ වෙයි. නම් හයක් ඇති විට ජනඅනුපාතය අනුව ගතහොත් නම් පහක් සිංහලයන්ගේ විය යුතු ය. පස්දෙනකු නැත්නම් අඩුම තරමින් හතරදෙනකු සිංහල විය යුතු ය. අද සිංහලයන් අතර පනස්හයෙන් පසුව කිසි දිනෙක නොතිබූ අයුරින් ජාතික හැඟීමක් ඇති වී තිබේ. ඇතැම්විට ඒ පනස්හයේ තිබූ තත්වයටත් වැඩිවිය හැකි ය. එහෙත් ව්‍යවස්ථාදායක මණ්ඩලයට යෝජනා වී ඇති නම්වලින් ඒ තත්වය නිරූපණය වේ ද? ඒ නම් අතර සිංහලයන්ගේ නම් කොපමණ වේ ද? සිංහල නමක් තිබුණ ද ජයදේව උයන්ගොඩ නම් තැනැත්තා විසින් නිරූපණය කරනු ලබන්නෝ කවරහුද? පඬියකු පවසනු ඇත්තේ ඒ සාමාජිකයන් නම්කරනු ලැබ ඇත්තේ දේශපාලන පක්ෂ විසින් මිස ජනවර්ග විසින් නොවන බව ය. අපට ඇති ප්‍රශ්නය ද එයම ය. මණ්ඩලවලට ජනවාර්ගික ව සාමාජිකයන් පත්කිරීම නුසුදුසු වුවත් අද ඊනියා දේශපාලන පක්ෂ යටතේ සිදුවන්නේ එය ය. ව්‍යවස්ථාදායක මණ්ඩලයෙහි තවත් සාමාජිකයකු වන හිටපු විනිසුරු විග්නේස්වරන් මහතා දෙමළ ජාතිවාදයට පක්ෂ කතා ප්‍රසිද්ධියේ ම කර ඇති තැනැත්තෙකි. සිංහල ජාතිකත්වය නියෝජනය කරන එක් සාමාජිකයකු හෝ ව්‍යවස්ථා මණ්ඩලයෙහි නැත්තේ ඇයි?

මෙරට දෙමළ ජාතිවාදය ව්‍යවස්ථාදායකයෙහි ඇතිවූයේ දහනවවැනි සියවසෙහි දී ජනවාර්ගික අනුපාතය නොතකා නිල නොලත් මන්ත්‍රීවරුන් ලෙස එක් සිංහලයකු, එක් දෙමළ ජනවාර්ගිකයකු, එක් බර්ගර් ජනවාර්ගිකයකු පත්කිරීම මගිනි. එදා සිට දෙමළ ජාතිවාදී නායකයෝ බ්‍රිතානි ආණ්ඩුකාරයන් සමග එක්වී ව්‍යවස්ථාදායකයෙහි සිංහලයන් සුළුතරය බවට පත්කිරීමට උත්සාහ කළහ. රාමනාදන්, අරුණාෂලම්, පොන්නම්බලම් වැන්නන්ගේ සිංහල විරෝධී සටන ඒ පදනම් කරගෙන ක්‍රියාත්මක විය. සර්වජන ඡන්දයෙන් පසුව, විශේෂයෙන් ම සෝල්බරි ව්‍යවස්ථාවෙන් පසුව මධ්‍යයෙහි සිංහලයන් සුළුතරය බවට පත්කිරීමට නොහැකි බව තේරුම්ගත් චෙල්වනායගම් උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනම දෙමළ රාජ්‍යයක් පිහිටුවීමට පක්ෂයක් ආරම්භ කෙළේ ය. ඔහු පක්ෂයක් පමණක් නොව ප්‍රභාකරන් ද බිහි කෙළේ ය. බටහිරයන් ආයුධ, ගුවන්යානා, සබ්මැරීන ආදිය කොටින්ට සපයා උතුරු හා නැගෙනහිර පළාත් පමණක් නොව මුළු රටම කොටින්ට දීමට කටයුතු කර ඇති බව පැහැදිලි ය. මානුෂික මෙහෙයුම් තව අවුරුද්දක් පමා වී නම් ඔවුන්ගේ උත්සාහය සාර්ථක වීමට තිබුණි. එහෙත් එයට දැන් ඉඩක් නැත.බටහිරයෝ තමන්ට එසේ කළ නොහැකි වූ දෙය වෙනත් මාර්ගවලින් ඉටුකරගැනීමට කටයුතු කරති. ව්‍යවස්ථා මණ්ඩලය ඉන් එකකි. ඒ ඔස්සේ අපි නැවතත් ප්‍රශ්නයේ මුලට ම යමු. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ තිදෙනෙක් සිංහල නොවන්නෝ වෙති. සිංහල නම් තුනෙන් එකක් උයන්ගොඩගේ ය. එහි විග්නේස්වරන්ලා සිටිය ද සිංහල ජාතිකත්වය මත පදනම් වූ අය නැත. පොන්නම්බලම්ගේ පනහට පනහ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙයි. අවුරුදු එකසිය හැත්තෑ ගණනකට පසුව සටන් මෙහෙයුම් ද ජයග්‍රහණය කර අප ආපසු ප්‍රශ්නයේ මුලට යා යුතු ද? දහහත්වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසිකිරීමට වහාම කටයුතු කිරීමට නොහැකි නම් එයට සාමාජිකයන් තෝරන ක්‍රමය වෙනස් කළ යුතු ය. එසේ නොකරන්නේ නම් ඒ රණවිරුවන්ගේ සියළු කැපකිරීම් නැතිභංග කිරීමකි.

රණවිරුවන්ගේ ජයගගහණ ආපසු හැරවීමට තැත්කරන්නෝ තවත් වෙති. මුලතිව්හි කොටු කෙරී සිටින සාමාන්‍ය ජනයා නිදහස් කිරීමට යැයි කියමින් එක්සත් ජාතීන්ගේ හමුදා මෙරටට එවීමේ වෑයමක් පවතියි. බ්‍රිතානීහු ද එහි දී එක්සත් ජාතීන්ට පොහොර දමති. මේ හමුදා එමට තැත්කරන්නේ පළිහක් ලෙස යොදා ගැනෙන දෙමළ ජනතාව කෙරෙහි කරුණාවෙන් නොවන බව පැහැදිලි ය. බටහිරයන්ට අවශ්‍ය කොටින්ට හුස්මගැනීමට ඉඩක් ලබා දී නැවතත් ත්‍රස්තවාදයට පණ පෙවීමට ය. බටහිරයන් දෙමළ ජනතාව කෙරෙහි කරුණාවක් දැක්වී නම් ඔවුන්ට තිබුණේ බොහෝ කලකට පෙර ම ඒ ජනතාව ප්‍රභාකරන්ගෙන් මුදාගැනීම ය. අවුරුදු විස්සකට වැඩි කලක් තිස්සේ මේ ජනතාව නිර්වින්දනය කරනු ලැබ සිටිති. ඔවුන්ට ප්‍රතිකාර කරන ඇතැම් වෛද්‍යවරුන්ගේ මතය වනුයේ ඔවුන් හැඟීම්වලින් වියෝ වී සිත් පිත් නැති රූකඩ බවට පත්වී සිටින බව ය. ආණ්ඩුව අවසාන මොහොතේදීවත් බටහිරයන්ට හෝ ඉන්දියාවට හෝ කන් නොදිය යුතු ය. කිසිම අයුරකින් රණවිරුවන්ගේ ජයග්‍රහණ ආපසු හැරවීමට ඉඩ නොදිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva